# 18. විදේශ සේවා නියුක්තිය සහ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳුබව - ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක් ඇසුරින්

ඊ. එම්. සමන්ත ඒකනායක, සමාජ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය, සමාජීය විද්‍යා දෙපාර්තමේන්තුව, රජරට විශ්වවිද්‍යාලය

## 01. හැඳින්වීම

ශ්‍රම අපනයනය, රටක ආර්ථික සංවර්ධනය කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කරයි. විදේශ රැකියා නියුක්තිකයින්ගේ පෞද්ගලික සංක්‍රාමයන් ඊට සෘජු ලෙස බලපා ඇත. දේශීය ආදායම් රහිත පිරිස් හා ඌන සේවා වියුක්තිකයෝ විදේශගත වීමෙන් උපයන්නා වූ ධනය රටෙහි ආයෝජනය සඳහා මූල්‍ය ධනය සම්පාදනයට විශාල දායකත්වයක් දරති. (Chandadarkar 1980 - 30 pg) 1997 වන විට සමස්ත අපනයන ඉපයීම්වලින් 20%ක් පමණ උත්පාදනය වූයේ ශ්‍රම අපනයනය තුළින් වන අතර එය 1980 දශකයේ මැද භාගය වන විට එම කොටස මුළු අපනයන ඉපයීම්වලින් පහෙන් එකකට පමණ දායක වෙමින් රටෙහි ප්‍රධාන විදේශ විනිමය ඉපයීමේ මාර්ගයක් බවට පත්ව ඇත. (ජයවික්‍රම ආනන්ද 2000. පිටු 115)

යම් පුද්ගලයෙකු එක් ස්ථානයක සිට සාපේක්ෂ වශයෙන් ඉතා හොඳ පරිසරයකට ගමන් කිරීම සංක්‍රමණය ලෙස සරලව අර්ථ දැක්විය හැකිය. සාංක්‍රමණික ලක්ෂණයන් අතර ශ්‍රම සංක්‍රමණය විවිධ තල්ලු කිරීම් හා ඇද ගැනීමේ සාධක රාශියක ප්‍රතිඵලයක් ලෙස හුවා දැක්විය හැකිය. ශ්‍රම සංක්‍රමණය සිදුවෙනුයේ මානව සම්පත් තැනෙකින් තවත් තැනකට විතැන් වීමෙනි.

සංක්‍රමණයන් සම්බන්ධයෙන් ඓතිහාසික සාක්ෂි පැවතිය ද ශ්‍රම සංක්‍රමණය, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලන සමය පැවති විසිවන සියවසේ මුල් භාගය තරම් වූ කෙටි ඉතිහාසයක් පවතින්නකි (Rathnayake, Kanthi 1999) ශ්‍රී ලංකිකයන් විදේශ රැකියා සඳහා සංක්‍රමණය වීම මුල් වරට වාර්තා වන්නේ ලාංකීක ද්‍රවිඩයන් පිරිසක් මැලේසියාව, සිංගප්පූරුව හා හොංකොං යන රටවලට සංක්‍රමණය වීම සමග ය. (Gunathilake, Godfrey 1998) කෙසේ වුව ද, ශ්‍රම සංක්‍රමණය සම්බන්ධයෙන් පැහැදිලි තොරතුරු වාර්තාගත වීම 1948 ලාංකේය නිදහසින් පසු සිදු විය. විශේෂයෙන් විදේශීය සම්භවයක් ඇති ලාංකේය බර්ගර් වාර්ගික කණ්ඩායම් ඕස්ට්‍රේලියාව, නවසීලන්තය වැනි රටවලට සංක්‍රමණය වීම දැක්විය හැකිය.

1960 දශකයේ අවසාන භාගය වන විට ශ්‍රම සංක්‍රමණය නව ප්‍රවණතාවක් දක්වයි. එනම් මෙම සංක්‍රමණයන් අධ්‍යාපනික හා වෘත්තීය නිපුණතාවන් ඇති

පිරිසකට සීමා වීමය. (Koral RBM 1983) උසස් අධ්‍යාපනය ලත් වෛද්‍ය, ඉංජිනේරු. ගණකාධිකාරී සහ ගුරු වෘත්තිකයින් විදේශීය සංක්‍රමණ සඳහා යොමු වී ඇත. විශේෂයෙන් වෛද්‍යවරු එංගලන්තය, ඇමරිකාව, ඕස්ට්‍රේලියාව, කැනඩාව හා නවසීලන්තය වැනි රටවල්වලට සංක්‍රමණය වී ඇත. (Gunathilake, Godfrey 1998) කෙසේ වුව ද, 1956-60 කාල පරාසය තුළ වෛද්‍යවරුන් 108ක් බ්‍රිතාන්‍යයේ පුරුවැසිභාවය ලබාගෙන ඇත. (Ruhunage 1996) මෙම තත්ත්වය 1970 දශකය වන විට ප්‍රවර්ධන විය. ශ්‍රී ලාංකේය සමාජය තුළ සිදු වූ මෙම බුද්ධි ගලනය රටේ සංවර්ධනයට සෘණාත්මක බලපෑමක් එල්ල කරන ලදී.

1970 දශකය ආරම්භ වත් ම ලාංකේය ශ්‍රම සංක්‍රමණයෙහි විශාල පෙරළියක් ඇති විය. ඒ සඳහා බලපාන ලද සාධකය වූයේ ඔපෙක් සංවිධානය (OPEC) 1974 වර්ෂයේ අමුතෙල් බැරලයක මිල ඇමරිකානු ඩොලර් 11.65 සිට 33 දක්වා වැඩි කිරීමය. (ආර්ථික විමසුම 1981) තෙල් මිළ ඉහළ දැමීමත් සමග විශාල ප්‍රාග්ධන අතිරික්තයක් ඔවුන් සතු වූ අතර ඒවා ආයෝජනය සඳහා දේශීය වශයෙන් මෙන් ම විදේශ වශයෙන් ද අවධානය යොමු කෙරිණි. විදේශීය ආයෝජනයන් කෙරෙහි එතරම් අවබෝධයක් නොලත් මොවුහු දේශීය ආයෝජනයන් කෙරෙහි එනම් දේශීය ගොඩනැගිලි ව්‍යාපෘති ඉදිකිරීම් මෙන් ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම කෙරෙහි වඩාත් නැඹුරු වූහ. (ආර්ථික විමසුම 1981)

සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කළ ද ඒ සඳහා පුහුණු ශ්‍රමිකයන් මෙන් ම මානව සම්පත් ඌනතාවට ද ඔවුහු මුහුණ දුන් හ. මෙම ගැටලුවට මුල් අවදියේ දී යම් තරමක හෝ දායකත්වයක් ලබා ගනු ලැබුවේ වඩාත් දිළිඳු අරාබි රාජ්‍ය වලින් හා ජෝර්දානය, යේමනය, අෆ්ගනිස්ථානය වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල් වලිනි. මේ සඳහා ශ්‍රී ලංකාවට ද ශ්‍රමය සැපයීමට ඉඩ ප්‍රස්ථාවක් ලැබිණි.

ආරම්භක අවස්ථාවේ දී මැද පෙරදිග රැකියා සඳහා වැඩි ඉඩ ප්‍රස්ථාවක් පුරුෂ පක්ෂයට ලැබිණි. ශ්‍රී ලංකාවේ 1976 සිට 1980 දක්වා ශ්‍රම සංක්‍රමණික දත්ත විශ්ලේෂණය කර බැලීමේ දී මේ බව මනාව ස්ඵුට වේ. 1976 දී පුරුෂ ශ්‍රම සංක්‍රමණය 99.05% වැනි ඉහළ අගයක් වූ අතර 1980 වන විට එය 49.22% දක්වා පහත වැටුණි. 1976 කාන්තා ශ්‍රම සංක්‍රමණය 0.95%වැනි පහළ අගයකට සිට 1980 වර්ෂය වන විට 50.77% දක්වා වර්ධනය විය. ඉදිකිරීම් සංකෝචනය වීමත් සහ ව්‍යාපෘති වැඩ අවසන් වීම පුරුෂ ශ්‍රම සංක්‍රමණය අඩු වීම කෙරෙහි බලපාන ලදී. අනෙක් අතට ශ්‍රී ලංකාවේ 1977 වර්ෂයේ ඇති කරන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සෘජුව ම හේතු සාධක වී ඇත. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හේතුවෙන් කාන්තා ශ්‍රම සංක්‍රමණයට අවකාශය ලැබීමත් සමග ම මැද පෙරදිග රටවලට ලාංකේය කාන්තාවන් ගෘහ සේවිකාවන් ලෙස සංක්‍රමණය සිදු විය. මෙම අධි ගෘහ සේවක

සංක්‍රමණයට හේතුව මැද පෙරදිග රටවල සංවර්ධනයත් සමග ඇති වූ සමාජීය තත්ත්වයේ වෙනස, එක් අතකින් ඔවුන්ගේ සමාජීය තත්ත්වය හුවා දැක්වීමට ගත් උත්සහයක ප්‍රතිඵලයක් විය හැකිය. කෙසේ නමුදු 1975න් පසු ශ්‍රම ඉල්ලුම පහත වැටුණ ද ගෘහ සේවක ඇබෑර්තු සඳහා පැවති ඉල්ලුම ස්ථාවරව පැවතුණි. (Ruhunage 1996) ගෘහ සේවිකාවන්ගෙන් වැඩි පිරිසක් මැද පෙරදිගට සංක්‍රමණය වන අතර සුළු පිරිසක් නැගෙනහිර ආසියාව හා වෙනත් රටවලට විගමනය වූහ. ආසියාවේ හා මැදපෙරදිග ගෘහ සේවයේ නියුතු කාන්තාවන් මිලියනයක් පමණ වන බව තත්කාලීන ඇස්තමේන්තු වාර්තා දක්වයි. (Shariffe 2001) මෙසා විශාල සංඛ්‍යාවක් වාර්ෂිකව සංක්‍රමණය වන ලාංකේය කාන්තාවන්ගේ සුභසාධනය හා ආරක්ෂාව පිළිබඳව රජයේ අවධානය යොමු වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1985 අංක 21 දරන පනත යටතේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිහිටුවනු ලැබීය. (ආර්ථික විමසුම 1996) මේ තුළින් වන සුභසාධනය හා ආරක්ෂාව හේතුවෙන් කාන්තා ශ්‍රම සංක්‍රමණය තවදුරටත් වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

කෙසේ වෙතත් විදේශ සේවා නියුක්තිය සඳහා බලපාන ලද සාධක මෙසේ දක්වාලිය හැකිය. (අත්තනායක චන්ද්‍රා 1996) 1.සාමාන්‍ය රැකියා සඳහා දේශීය වශයෙන් ගෙවනු ලබන වැටුප් හා සැසැඳීමේ දී මැද පෙරදිග ඉහළ වැටුප් ලැබීම. 2. සාමාන්‍ය රැකියා දේශීය වශයෙන් පිළිගැනීමේ දී බාධක වශයෙන් ඉස්මතුවන සමාජ, සංස්කෘතික ආකල්ප. 3. නාගරීකරණය, අධ්‍යාපනය හා නවීකරණයේ බලපෑම් හා ඒ ඇසුරින් සමාජ, සංස්කෘතික ඇගයීම්වල නියුතු ඥාති මිත්‍රාදීන්ගේ බලපෑම. 4. මෙම ප්‍රදේශවල රැකියාවල ඇතිවන වෙනස්කම් 5. නොමිලේ ආහාර, නවාතැන්, ඇඳුම් සහ සමහර අවස්ථාවන්හි ටිකට්පත් ආදිය ලබාදීම. 6. විදේශ රටක සේවා නියුක්ත කෙටිකාලය තුළ වුව ද සෑහෙන මුදල් ප්‍රමාණයක් ඉතිරිකරගත හැකිවීම. 7. දිළිඳුකමින් මිදීමට රැකියා මාර්ගයන්ට අවතීර්ණ වීමට සිය රට තුළ ඉඩ ප්‍රස්ථා නොමැති වීම යනාදියයි.

## ස්ත්‍රී-පුරුෂ විදේශ සේවා නියුක්තිය

*වගු අංක 01*

| වර්ෂය | පිරිමි | % | ගැහැණු | % | එකතුව |
|---|---|---|---|---|---|
| 1986 | 10,618 | 67 | 5,191 | 33 | 15,809 |
| 1994 | 16,377 | 27 | 43,791 | 73 | 60,168 |
| 2000 | 59,725 | 33 | 1,21,645 | 67 | 1,81,370 |

Source : Research Division SLBFE, Information Division SLBFE (Statistical Handbook, 2000)

ඉහත සඳහන් වගුවට අනුව කාන්තා ශ්‍රම සංක්‍රමණය 1994 වර්ෂය වන විට 73%ක වර්ධනයක් පෙන්වයි.

**පුරුෂ ශ්‍රම සංක්‍රමණ, කාන්තා ගෘහ සේවිකාවන්, හා වෙනත් සංක්‍රමණ**

*වගු අංක 02* *(1991-2000)*

| වසර | පුරුෂ | ගෘහ සේවිකාවන් | වෙනත් | එකතුව |
|---|---|---|---|---|
| 1991 | 21,423 | 34,857 | 8.703 | 43,560 |
| 1992 | 15,493 | 22,092 | 7,067 | 29,150 |
| 1993 | 17,153 | 24,240 | 7,360 | 31,600 |
| 1994 | 16,377 | 36,104 | 7,687 | 43,791 |
| 1995 | 46,021 | 1,13,860 | 12,608 | 1,26,468 |
| 1996 | 43,112 | 1,10,479 | 8,985 | 1,19,464 |
| 1997 | 37,552 | 99,427 | 13,302 | 1,12,731 |
| 1998 | 53,867 | 85,349 | 20,600 | 1,05,949 |
| 1999 | 63,504 | 37,710 | 27,900 | 1,15,610 |
| 2000 | 59,725 | 98,636 | 23,009 | 1,21,645 |

Source : Statistical Handbook, 2000

ඉහත වගුවෙන් පැහැදිලි වන ආකාරයට කාන්තා ශ්‍රම සංක්‍රමණය ඉහළ අගයක් ගනී. එයින් ගෘහ සේවිකාවන් වශයෙන් සංක්‍රමණය වීම 80%ක් තරම් අගයක් වාර්තා වේ. මේ සඳහා 1977 ඇතිකරන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සමග සහනාධාර සීමාකිරීම් ද හේතු විය. මෙම නිසා දුප්පතුන්ට, පැවති ආර්ථික ක්‍රමයට මුහුණදීම සඳහා මැදපෙරදිගට සංක්‍රමණය වීම විකල්පයක් විය. (Malsiri Dias 1989) මෙය දිළිඳු බවින් මිදීමට තිබූ ඉතා පහසුම හා වාසිදායකම මාර්ගය ලෙස කාන්තාවෝ කල්පනා කළහ. (කුරුදූ කුඹුර 1987)

### වාර්ගිකත්වය අනුව ශ්‍රම සංක්‍රමණය

*වගු අංක 03*

| ජන වර්ගය | *1971* | *1981* | *1994* |
|---|---|---|---|
| සිංහල | 71.9 | 74.0 | 84.0 |
| දෙමළ | 20.4 | 18.2 | 8.9 |
| මුස්ලිම් | 6.5 | 7.1 | 6.2 |
| වෙනත් | 1.2 | 0.7 | 0.9 |

Source : Statistical Handbook, 2000

වාර්ගිකත්වය අනුව ශ්‍රම සංක්‍රමණ දෙස අවධානය යොමුකර බැලීමේ දී සිංහල සංක්‍රමණිකයින්ගේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළ ද දමිළ සංක්‍රමණික අඩුවීමක් පෙන්නුම් කරයි. මෙම තත්ත්වයට ලංකාවේ උද්ගත වූ ජනවාර්ගික යුද්ධය ද බලපා ඇති බව අධ්‍යයනවේදීහු පෙන්වා දෙති. මුස්ලිම් සංක්‍රමණ සාපේක්ෂව ස්ථාවර අගයක් පෙන්නුම් කරයි. අරාබි රාජ්‍යයන්හි මුස්ලිම් ජනතාව සඳහා රැකියා අවස්ථා පහසුවෙන් ලබාගත හැකි වූයේ මොවුන් ද ඉස්ලාමීය ආගම අදහන පිරිසක් වීම හේතුවෙනි.

### ශ්‍රම සංක්‍රමණය දිස්ත්‍රික්ක අනුව

*වගු අංක 04*

| දිස්ත්‍රික්කය | *1979* | *1984* |
|---|---|---|
| කොළඹ | 57.6 | 17.6 |
| නුවර | 4.0 | 9.4 |
| කුරුණෑගල | 1.3 | 10.4 |
| අනුරාධපුරය | 0.2 | 4.0 |

Source : Statistical Handbook, 2000

මැදපෙරදිග සංක්‍රමණයන්ට මුලින් ම නාගරික අඩු ආදායම් ලාභී පවුල් යොමු විය. (මුඩුක්කු වාසීන්) එහෙත් පසුව එය ග්‍රාමීය ප්‍රදේශවලට ව්‍යාප්ත විය. (Hettige, 1998)

වර්තමානය වන විට දළ දේශීය නිෂ්පාදනයට විදේශ සේවා නියුක්තිය විශාල දායකත්වයක් දක්වනු ලබයි.

**පුද්ගල සංක්‍රාම හා විදේශ විනිමය ඉපයීම**

*වගු අංක 05 1980-2000*

| වසර | පුද්ගල සංක්‍රාව | තේ | රබර් | පොල් | ඇඟලුම් | එකතුව | % |
|---|---|---|---|---|---|---|---|
| 1980 | 2,517 | 6,170 | 2,590 | 1,234 | 1,814 | 17,598 | 14.3 |
| 1990 | 16,054 | 19,823 | 3,080 | 2,783 | 25,163 | 79,484 | 20.1 |
| 1999 | 74,342 | 43,728 | 2,305 | 9,119 | 1,55,214 | 3,25,171 | 22.8 |

Source : Statistical Handbook, 2000

ඒ අතර ගෘහ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන දායකත්වය වැඩි අගයක් ගනු ලබයි. එහෙත් මෙහි ධනාත්මක තත්වයන් පිළිබඳ පමණක් නොව සෘණාත්මක තත්ත්වයන් කෙරෙහි වර්තමානයේ අධ්‍යයනවේදීන්ගේ අවධානය යොමුකොට ඇත.

02. **දිළිඳුබව සහ දිළිඳුබව පිළිබඳ ගැමියන්ගේ දෘෂ්ටිය**

ශ්‍රී ලංකාවේ වර්තමාන ජනගහනය මිලියන 20ක් පමණ වන අතර වාර්ෂික ජනගහන වර්ධන වේගය 1.2%කි. දළ ජාතික නිෂ්පාදනය පහළ අගයක් පෙන්නුම් කළ ද මානව සංවර්ධනය ඉහළ නංවාගත් රටක් ලෙස හඳුන්වා දිය හැකිය. ඒ මන්දයත් රජය අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සුභසාධන වැඩසටහන් සඳහා ආයෝජනය කර ඇති බැවිනි. මේ නිසා ශ්‍රී ලංකාවේ මානව සංවර්ධනය කාර්මික රටවලට සමාන මට්ටමක පවතී. (Indra Tudawe, 2000) එහෙත් දරිද්‍රතාව තුරන් කිරීමට මෙම සුභසාධන ක්‍රියාවලිය සමත් වී නොමැත.

1981 ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්තයන්ට අනුව ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 40%ක් දරිද්‍රතාවෙන් පෙළෙන බව පැහැදිලි වේ. වර්තමාන පර්යේෂකයින් පෙන්වා දෙන්නේ මෙම තත්ත්වය 60%ක් දක්වා වර්ධනය වී ඇති බවයි. මෙම දරිද්‍රතාව තීරණය කරනු ලබන්නේ .

"A person is considered poor if his or her consumption or income level falls below some minimum level necessary to meet the basic needs. This minimum level is called "Poverty Line" (World Bank Report, 2000)

යම් පුද්ගලයෙකුට අවශ්‍ය අවම පරිභෝජන සක්‍යතාව සපුරා ගැනීමට නොහැකි වූවත් දිළිඳු බවේ රේඛාවට යටත් වේ. ලෝක බැංකු වාර්තාවට අනුව 1998 ලෝක ජනගහනයෙන් බිලියන 1.2ක් දිළිඳු බවේ රේඛාවට හසු වන බව සනාථ වේ. ශ්‍රී ලංකාවේ වත්මන් පර්යේෂණ තොරතුරුවලට අනුව ග්‍රාමීය දිළිඳු බව සාපේක්ෂ වශයෙන් නාගරික හා වතු අංශයන්ට වඩා ඉහල අගයක් පෙන්නුම් කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ කලාපීය වශයෙන් දිළිඳුව (1990/1991)

| *Sector* | *Poor Level I* | *Poor Level 2* |
|---|---|---|
| All Island | 30.4 | 27.4 |
| Urban | 18.2 | 16.3 |
| Rural | 34.7 | 31.3 |
| Estate | 20.5 | 18.0 |

Source : Household income and expenditure Survey 1990/91, Department of Census and Statistics.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව ප්‍රධාන වශයෙන් ග්‍රාමීයව පවතින ප්‍රපංචයක් ලෙස හැඳිනගත හැකිය. ග්‍රාමීය දරිද්‍රතාව ජනගහනයෙන් 4/5ක් ලෙස දක්වයි. දරිද්‍රතාව ව්‍යාප්තිය ග්‍රාමීය, නාගරික සහ වතු අංශයන්හි පිළිවෙලින් දිළිඳු බව (by the reference poverty line SL Rs. 471.20/person/per month) 79%, 17% සහ 4% බව පෙන්වා දිය හැකිය. (Abeyratne, Bandara 2000)

ග්‍රාමීය දිළිඳු බව පිළිබඳ සැලකීමේ දී භූගෝලීය වශයෙන් ද එහි විවිධතාව අවබෝධ කොට ගත හැකිය. බස්නාහිර පළාත හැර උතුරු නැගෙනහිර, උතුරු මැද, මධ්‍යම, ඌව සහ සබරගමුව යන පළාත්හි (ග්‍රාමීය) දිළිඳු බව ඉහළ අගයක් පෙන්නුම් කරයි. ග්‍රාමීය අංශ කෙරෙහි සංවර්ධන ව්‍යාපෘති අසමානාකාරයෙන් බෙදී යාම එහි දරිද්‍රතාව ඉහළ අගයක් ගැනීමට හේතු වී ඇත. 1990/1991 දී ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල් ආදායම රු. 708.00 ලෙස වාර්තා වේ. එය නාගරික අංශය රු. 1096.00 ද ග්‍රාමීය අංශය රු. 614.00 ද වතු අංශය රු. 514.00 ද විය. ඉහළ ම ඒක පුද්ගල ආදායම බස්නාහිර පළාතෙන් ද අවමය උතුරු මැද පළාතෙන් ද වාර්තා විය. (Abeyratne, Bandara 2000)

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 72%ක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වෙති. රැකියා නියුක්තිය සලකා බැලීමේදී ග්‍රාමීය අංශය නාගරික අංශයට වඩා ඉදිරියෙන් 12.3% පමණ රැකියා නියුක්තියක් (1995 Figuers) වාර්තා වන විට එය නාගරික අංශය

14.2% තරම් අගයක් පැවතුණි. එහෙත් තත්කාලීන ග්‍රාමීය ප්‍රදේශයන්හි කෘෂි ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුතු පිරිස ද දිනෙන් දින අඩුවීමක් දැකිය හැකිය. 1999 වර්ෂයේ 55.5% ක් වූ කෘෂි ක්ෂේත්‍රයේ රැකියා නියුක්තිය 1995 වන විට 44.1% දක්වා පහත වැටීමක් දැකිය හැකිය. (Abeyrathna Bandara, 2000) මේ සඳහා විවිධ සාධක බලපා ඇති බව පැහැදිලි වෙයි. ඒ අතර කෘෂි නිෂ්පාදන යෙදවුම්හි මිළ ඉහළ යාම, වාරි ජලය අඩු වීම සහ නිෂ්පාදන සඳහා හොඳ වෙළඳපොලක් නොතිබීම වැනි කාරණා මූලික වී ඇත. මේ හේතුව නිසා ග්‍රාමීය ජනතාව විවිධ රැකියා අංශ කෙරෙහි වැඩි නැඹුරුතාවක් දක්වීමට යොමුව ඇත. ඇඟලුම් කර්මාන්ත, විදේශ සේවා නියුක්තිය (ගෘහ) යන උභය අංශය කෙරෙහි ග්‍රාමීය කාන්තාව යොමුව ඇත.

මව්වරුන් විදේශ ගතවීමට බලපාන ප්‍රධාන හේතු වූයේ තම පවුල තුළ ගොඩ නැගී තිබුණු ආර්ථික දුෂ්කරතාවයි. මෙම පවුල්වල ගෘහ මූලිකයා ආර්ථික ක්‍රියාවලියේ නියළුණි. මොවුන් ද වැඩි පිරිසක් කම්කරු වෘත්තීන්හි නියලෙන්නන් වෙති. මොවුන්ගේ ආදායම පවුලේ මූලික අවශ්‍යතාවන් සපුරා ගැනීම ප්‍රමාණවත් නොවුණි. මේ නිසා පවුල තුළ ගොඩ නැගුණු ආර්ථික අගහිඟකම්වලට විසඳුමක් සෙවීම සඳහා මව්වරු විදේශ ගත වූහ.

අඩු ආදායම ලාභී පවුල්වලින් විශාල සංඛ්‍යාවක් විදේශගත වී ඇති බව සහ එම කාන්තාවන්ගේ පුරුෂයින් ස්ථිර රැකියාවක් නොකරන අතර ඔවුන්ගේ දරුවෝ කුඩා වයස්වල පසුවන්නෝ වෙති. අනෙක් අතට මෙම කුඩා වයසේ පසුවන ළමුන් පාසල් යාමට අකමැති බවත්, වැඩිහිටි ළමුන් මත්ද්‍රව්‍යවලට, මත්පැන්, දුම්පානය හා සොරකමට පෙළෙඹෙන බවත් පෙනේ. වැඩිහිටි ගැහැණු ළමුන් අයතා ප්‍රේම සබඳතාවලටත් හා හිතුවක්කාර විවාහවලට යොමුවන බවත් පෙනේ (Vijitha Fernando, 1990) කෙසේ වෙතත් ග්‍රාමීය කාන්තාව විදේශගතවීම පිළිබඳ පුරුෂ පක්ෂය තුළ දෙගිඩියාවක් හටගන්නා බවත් එහෙත් ආර්ථික වශයෙන් ලබන වාසිය පිරිමින් අගය කරන බව මහාචාර්ය එස්. ටී. හෙට්ටිගේ පෙන්වා දෙයි (1998) ඔහු තවදුරටත් කාන්තාවන් විදේශගතවීමේ අපේක්ෂා පෙන්වා දෙයි. එනම් 01. ජීවත්වන පැල්පත වෙනුවට උළු සෙවිලිකළ නිවසක් සැකසීම, 02. දූ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීම, 03. දුවට දෑවැද්දක් දී හොඳ විවාහයක් කරදීම, 04. උකසට තැබූ ගෙවත්ත බේරා ගැනීම යනාදියයි.

දරිද්‍රතාව හා විදේශීය සංක්‍රමණය නම් ප්‍රපංච දෙක අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධතාවක් දක්වයි. දරිද්‍රතාව නිසා විදේශ සංක්‍රමණ වන අතර ඒ තුළින් ඔවුහු දිළිඳු බවින් අත්මිදීමට සමත් වේ ද ? යන ගැටලුව මතුවනු ඇත. මන්දයත් මෙම ජනතාව දරිද්‍රතාව පිළිබඳව පවත්නා ආකල්පයන් වේ. දිළිඳුබව ලෙස අර්ථ දක්වන්නේ

යම් කිසි පුද්ගලයෙකුට අවශ්‍යය අවම පරිභෝජන සක්‍යතාව ලබා ගැනීමට නොහැකි වූ තත්ත්වයකි. එනමුත් මෙම නිසා මොවුනට අවශය වන්නේ ඒ සඳහා ප්‍රමාණවත් ආදායම් මාර්ගයකි. එහෙත් මෙම ජනතාව දිළිඳුබව ලෙස අර්ථ දක්වන්නේ ඔවුනට ස්ථිර නිවසක් නැති කම, ගෘහ භාණ්ඩ නැතිකම යනාදියයි. විදේශගත වීමේ අරමුණ ද ඒවා ලබා ගැනීමයි. ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක දී කාන්තාවක දිළිඳු බව පැහැදිලි කළේ.

"අපි දුප්පත්, අපිට කාගෙන්වත් පිහිටක් නැහැ. අපි දුප්පත් කියන්නේ ඉන්න හිටින්න ගෙයක් දොරක් නැහැ. ගෙට කිසි ම බඩු මුට්ටුවක් නෑ. ඉතින් අප කොහොමද පොහොසත් වෙන්නේ"

මෙම ආකල්පයේ සිට බොහෝ දෙනෙක් විදේශගතවන අතර ඉන් යම් පිරිසක් පූර්ණ නිවසක් තනා ගැනීමට සමත් වී ඇත. බොහෝ දෙනෙකුගේ නිවෙස් අර්ධ පූර්ණ ඒවා වෙයි. තවද මොවුහු සුඛෝපභෝගී භාණ්ඩ ගෙනෙන අතර විදේශ ගතවීමෙන් ටික කලක දී ඇතිවන හදිසි අවස්ථාවක් හේතුවෙන් මේවා විකිණීම හෝ උකස් තැබීම කෙරෙහි යොමුවෙති.

ළමයිගේ අධ්‍යාපනය වෙනුවෙන් ද මොවුහු වෙහෙසති. එහි දී ළමුන් සඳහා අවශ්‍ය පාසල් උපකරණ කෙරෙහි විශාල මුදලක් වැය කිරීමට මොවුහු පෙළෙඹෙති. සමස්තයක් ලෙස සලකා බැලීමේ දී මොවුන් දිළිඳුබව දකිනුයේ ස්ථිර නිවසක් නැතිකම, ගෘහ භාණ්ඩ නැතිකම, හා ළමයින්ට අධ්‍යාපනය ලබාදීමට අවශ්‍ය හොඳ පාසල් උපකරණ ලබාදීමට නොහැකිවීම ආදී තත්ත්වයන් වේ. මෙම නිසා ම මොවුහු උපයන මුදලින් පළමුව මේවා ලබාගැනීම කෙරෙහි යොමුවෙති. මෙම මුදල් ආයෝජනයට නොයෙදීම හේතුවෙන් ම දිළිඳු බවින් මිදීමට ඔවුහු අවකාශයක් නො ලබති. මෙම විදේශ සංක්‍රමණයෙන් මොවුන් විශාල මුදලක් උත්පාදනය කළ ද දිළිඳුබවින් මිදීමට නොහැකිවී ඇත. දිළිඳුබව පිළිබඳ මොවුන් තුළ පවතින් වැරදි ආකල්පය ද මීට හේතුවන බව පැහැදිලි වෙයි.

03. අධ්‍යයන ප්‍රදේශය සහ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය කිරීම සඳහා තෝරාගනු ලැබුවේ මහනුවර දිස්ත්‍රික්කයේ, ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹගහහේන 371 දරන ග්‍රාමසේවා වසමයි. එය යටිතල පහසුකම් දියුණු නොකළ ඉතා දුෂ්කර ගමකි. මෙම ගමෙහි ආරම්භක ස්ථානයට පමණක් ප්‍රවාහන පහසුකම් සැලසී ඇත. මාර්ගය ඉතා අබලන් තත්වයක පවතින අතර එක පෞද්ගලික බස් රථයක් පමණක් ජනතා ප්‍රවාහනය සඳහා යොදවා ඇත. ගම විශාල කන්දක් පුරා පැතිර ඇති අතර අඩි පාරවල් පමණක් පවතියි.

## ගමෙහි ජනගහනය

වගු අංක 07

| වයස | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| 05ට අඩු | 87 | 63 | 150 |
| 05-18 | 216 | 263 | 479 |
| 18-35 | 183 | 216 | 399 |
| 35-65 | 190 | 316 | 508 |
| 65ට වැඩි | පිරිමි සහ ගැහැණු | | 91 |
| එකතුව | | | 1629 |

මූලාශ්‍ර : සමෘද්ධි නිළධාරී වාර්තාව - 2004

2004 වසර වන විට පවුල් 196කින් යුත් ගමෙයි මළු ජනගහනය 1629ක් වේ. ගොඩ ඉඩම් අක්කර 465කින් හා මඩ ඉඩම් අක්කර 08කින් සමන්විත මෙම ගමෙහි මඩ කුඹුරු කිසිවෙක් වගා නො කරති. 2003 වසර තුළ පමණක් එක් පිරිමියෙක් සහ කාන්තාවන් 15 දෙනෙකු විදේශගතව ඇත.

අධ්‍යාපන මට්ටම් විමසීමේ දී උපාධිධාරීන් 02ක් ද. උසස් පෙළ විභාගය සමත් 16ක් ද, සාමාන්‍ය පෙළ සමත් 28ක් ද, දහවැනි වසර සමත් 21ක් ද, සිටින බව සමෘද්ධි සංවර්ධන නිලධාරී වාර්තාවලින් සනාථ විය.

### රාජ්‍ය හා පුද්ගලික අංශයන්හි සේවා නියුක්තිය

වගු අංක 08

| වෘතීය | පුද්ගලික අංශය | | රාජ්‍ය අංශය | | එකතුව |
|---|---|---|---|---|---|
| ක්ෂේත්‍රය | පිරිමි | ගැහැණු | පිරිමි | ගැහැණු | |
| ඇඟළුම් | 09 | 12 | | | 21 |
| ආරක්ෂක | | | 19 | | 19 |
| පොලීසිය | | | 03 | | 03 |
| ගුරු | | | 02 | | 02 |
| හෙද | | | | 01 | 01 |
| සමෘද්ධි ස.නි. | | | | 02 | 02 |
| එකතුව | 09 | 12 | 24 | 03 | 48 |

මූලාශ්‍ර : සමෘද්ධි සංවර්ධන නිලධාරී වාර්තාව 2004

මෙම ගමෙහි සමෘද්ධි ලාභී පවුල් 94ක් සිටින අතර එයින් රු. 600 මුද්දර 41ක් ද, රු. 350 මුද්දර 26ක් ද, රු. 250 මුද්දර 19ක් ද, රු. 140 මුද්දර 08ක් ද, වේ. පවුල් 15 හැර අනෙක් සියලු ම ගෙවල්වලට විදුලිය පහසුකම් ඇත. මෙම ගම් වැසියෝ කෘෂිකාර්මික කටයුතුවලට අමතරව බීඩි එතීමේ කාර්යයන්හි නියෙලෙති.

මෙම අධ්‍යයනය කිරීම සඳහා ප්‍රමාණාත්මක මෙන් ම ගුණාත්මක දත්ත රැස් කිරීමේ ක්‍රමෝපායන් යොදා ගත්තෙමි. සාහිත්‍ය ගවේෂණය කිරීමෙන් ප්‍රමාණාත්මක මෙන් ම ගුණාත්මක දත්ත රැස්කරගත් අතර ක්ෂේත්‍ර තොරතුරු රැස්කිරීම සඳහා ප්‍රත්‍යක්ෂ අධ්‍යන 10ක් සහ සම්මුඛ සාකච්ඡා සිදු කළෙමි. එහි දී සමෘද්ධි සංවර්ධන නිලධාරී හා සාකච්ඡා කළ අතර ඇය සතු වාර්තා ද උපයෝගි කර ගතිමි.

04. **විදේශ සංක්‍රමණ පවුල්වල ස්වභාවය (අඹගහහේන)**

අඹගහහේන ග්‍රාමීය සමාජයක් ලෙස හැඳිනගත හැකි ය. මන්ද යත් පහසුකම් අතින් යොදියුණු විශේෂයෙන් ප්‍රවාහන පහසුකම් සඳහා මාර්ග පහසුකම් ද ඉදිවී නොමැත. විදේශ සංක්‍රමණ පිළබඳ සැළකීමේ දී ඉතා විශාල සංඛ්‍යාවක් සංක්‍රමණය විමක් දැකිය හැකිය. උදාහරණයක් ලෙස 2003 වර්ෂය තුළ විදේශ රැකියා සඳහා 16 දෙනකේ මැද පෙරදිගට (කුවේට්, සවුදි රටවලට) සංක්‍රමණය වී ඇත.

විදේශ සේවා නියුක්තිය සඳහා බලපාන ලද ප්‍රබල සාධකය නම් ඔවුන්ගේ දරිද්‍රතාව යි. ස්ත්‍රී පුරුෂ වශයෙන් සලකා බැලීමේ දී එක් පුරුෂයෙක් පමණක් විදේශ ගත වී ඇත. ඔහු උපාධිධරයකු විම ද, විශේෂත්වයක් දක්වයි. අනෙක් සියලු ම දෙනා කාන්තාවන් වන අතර ඔවුහු ගෘහ සේවිකාවෝ වූහ. එක් අයෙක් පමණක් ඇඟලුම් කර්මාන්තයක සේවයේ නියුතුව ඇත. මෙම සංග්‍රමණික කාන්තාවන්ගේ ස්වාමිපුරුෂයෝ ස්ථිර රැකියාවක් නොකරති. මොවුනට ස්ථිර රැකියාවක් නොමැති අතරම විවිධ වූ කුළී සේවයෙහි (පිරිමින් ගස් කැපීම, පෙදරේරු අත්වැඩ) යෙදෙති. ආර්ථික අගහිඟකම් නිසා පිරිමින්ගේ කැමැත්ත මත කාන්තාව විදේශ ගතව ඇත. මෙසේ විදේශගත වීමට හේතු පිළිවෙලින් මෙසේ දැක්විය හැකි ය. 1. ගෙයක් සාදා ගැනීම. 2. ගෘහ භාණ්ඩ ලබාගැනීම. 3. ළමයින්ගේ අධ්‍යාපනය. 4. දරුවන්ගේ අනාගත කටයුතු කරදීම (විවාහ).

මෙම කාන්තාවන්ගේ ස්වාමිපුරුෂයන් රැකියාවක නියුතු නොවීම ද මොවුන්ගේ සංක්‍රමණයෙන් සඳහා හේතු වී ඇත. මන්ද දරුවන් රැකබලා ගැනීමේ කාර්ය ඔහු අති ඉටුවීම හේතුවෙනි. අධ්‍යයනට ලක් වූ කිසිම කාන්තාවක් ස්වාමිපුරුෂයාගේ අවසරය නොමැතිව ගිය අය නොවූහ. සමහර කාන්තාවන් සඳහා විදේශගත

වීමට පුරුෂයා බලකිරීම් කළ අවස්ථා ද තිබුණි. මෙයට ප්‍රධාන හේතුව ඔවුන්ගේ ජීවන තත්වය මෙන් ම නිවාස ද ඉතා දුප්පත්ම තත්වයක පැවතීමයි.

සංක්‍රමණයන් සඳහා බලපාන ලද තවත් සාධකයකි තරඟකාරිත්වය. මෙම ගමෙහි බොහෝ පිරිසක් නිවාස ඉදිකරගෙන ඇත්තේ විදේශගතවීම තුළිනි. එම නිසා තමන්ට ද ඒ තත්වයට පැමිණීමට සුදුදු ක්‍රමය සහ එම තත්වයට පැමිණීමේ අභිලාශයෙන් විදේශගත වීම දැකිය හැකිය. මෙහි දී තරඟකාරිත්වයක් පෙන්නුම් කරනුයේ පවතින තාවකාලික නිවාස වෙනුවට ස්ථිර නිවාසයක් ගොඩනගා ගැනීමේ අරමුණයි. මෙහි දී ඒ සඳහා අසල්වැසියන් හා සමවීමට හෝ අභිබවා යාමට ඔවුන් ද විදේශගත වීම කෙරෙහි යොමු වීමක් දැකිය හැකිය. එහි අරමුණ එසේ වුව ද සාර්ථකත්තයට පවුල් පරිසරය මෙන් ම විදේශගත වීමෙන් පසු පැවති පරිසරය ද එහි සාර්ථක අසාර්ථකභාවය කෙරෙහි බලපා ඇති බව පැහැදිලිය.

අනුකරණය ද කාන්තා විදේශ සංක්‍රමණය කෙරෙහි බලපාන ලද තවත් සාධකයකි. බොහෝ අවස්ථාවන්හි මවගේ සංක්‍රමණයෙන් පසු නිවාස තැනීම සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සහ අනාගත සැළසුම් උදෙසා මුදල් ඉතිරිය වැනි තත්වයන්ට ආශා කිරීම හේතුවෙන් ඔවුන් ද විදේශගතවීමට පෙළඹී ඇත. එසේ කිරීමෙන් ඔවුන් සඳහා ගෘහ භාණ්ඩ රැස්කිරීමක් දැකගත හැකිය. වයස අවුරුදු 23ක් වූ සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය හැදෑරූ තරුණියක් ප්‍රකාශ කර සිටියේ

"මගේ අම්මා කලින් රට ගියා. ඒ කරලා ගෙදරට බඩු ගොඩක් අරගෙන ආවා. ඉතින් මටත් ආශා හිතුනා බඩු ගන්න පුළුවන් වෙයි කියලා. ඇත්තට ම මම ඩුබායි ගිහින් අවුරුදු 2ක් ඉඳලා රූපවාහිනි, කැසැට්, විදුලි පංකා, ශීතරණ වාගේ බඩු ගොඩක් ගෙනවා. මට විතරක් නොවෙයි මල්ලිටත් එක්ක"

ඇය රට යාමට අරමුණ වූයේ කුමක් ද යන ප්‍රශ්නයට එසේ පිළිතුරු දුනි. ඇයට තම වැඩිමල් සහෝදරියක් බාල සහෝදරයෙක් විය. පියාට දෙමාපියන්ගෙන් ලැබුණ ස්ථිර නිවසක් ඇත. අගහිඟකම්වලට වඩා ඇයට රට යාමට හේතුව වූයේ බඩුවලට තිබෙන ආශාවයි. දෙමාපියන් තවදුරටත් අධ්‍යාපනය කරන ලෙස බලකරද්දී ඇය විදේශ ගතව ඇත. ඇය ගෙන එන ලද භාණ්ඩ අදටත් පාවිච්චියට නොගෙන ආරක්ෂාකර ඇයගේ දෑවැද්ද සඳහා වෙන්කර ඇත. තවද අය සතුව රු. 72,000 මුදලක් ද ඉතිරිව පවතියි.

සමස්තයක් ලෙස බැලීමේ දී වැඩි පිරිසක් විවාහක කතුන් විදේශගතවන්නේ ඔවුන්ගේ නැතිබැරිකම් නිසා ය. මේ සඳහා ඔවුන් සතු අත මුදල් නැතිකම නිසා ම මුදල් පොළියට ලබා ගැනීම, ඉඩමේ ඔප්පුව උකස් තැබීම වැනි ක්‍රමයන් තුළින් මුදල් සොයා ගන්නා අතර පසුව ගෙවීමේ දී ඔවුන් ඒ සඳහා විශාල පොලියක් ද ගෙවීමට ද සිදුව ඇත.

විදේශ ගත වීම තම අභිවෘද්ධිය සඳහා කළ ද, සමහර අවස්ථාවල දී ඔවුන් සිටි තැනින් තවත් පහළ වැටීමට මේ කාර්යය හේතු වී ඇත. අඹගහහේන පදිංචි වයස අවුරුදු 39 වූ කාන්තාවකට 1987 ජ. වි. පි භීෂණ සමයෙහි දී ඇගේ සැමියා අහිමිවී ඇත. දරුවන් සිව් දෙදෙක් සිටින ඇය ආර්ථික දුෂ්කරතා නිසා ම දෙවන විවාහයක් සිදුකර ගෙන ඇත. දැන් ඔවුන්ට දරුවන් පස් දෙනෙක් සිටිති. නව සැමියා ට ද ස්ථිර රැකියාවක් නොමැත. එක් කාමරයක් සහිත කටුමැටියෙන් සකසන ලද නිවසක ඔවුහු ජීවත් වෙති. දැඩි ආර්ථික අපහසුතා හේතුවෙන් ඇය කුවේටයට ගෘහ සේවය සඳහා යොමු වී ඇත. ඇය එහි සේවය කළ කාලය වසර තුනකි. පළමු අවුරුදු දෙක තුළ දී සේවා ස්ථානයන්හි කරදර හේතුවෙන් තැනින් තැනට මාරුවී ඇත. පළමු නිවසෙහි මාස හතක් ද, දෙවන නිවසෙහි මාස අටක් ද, සේවය කළ ද වැටුප් ලැබී නොමැත. ඇයට වැටුප ලැබී ඇත්තේ අවසාන අවුරුදු එක හමාර තුළ පමණි. විදේශ ගතවීම සඳහා මුදල් ලබා ගැනීමට රුපියල් 25,000ට උකස් තබන ලද ඉඩම බේරා ගැනීමට රු. 38,000ක් ගෙවීමට සිදුවී ඇත. මෙම හේතුන් නිසා ඇගේ විදේශ ගතවීමෙන් ඇයට කිසිදු වාසියක් නොමැති බව ප්‍රකාශ කළාය. ඇය අදටත් හව්හරණයක් නැති බව ප්‍රකාශ කරයි. ඇගේ ස්වාමියාට ඔහුගේ සහෝදරයා හා සම අයිති රබර් අක්කර 03ක ඉඩමක් ඇති අතර එහි ආදායම තම සැමියා පමණක් ලබන බවත් සහ එයින් මාසික රු. 5,000ක් ලබයි. එය ළමයින්ගේ අධ්‍යාපන කටයුතු සඳහාත් ජීවත් වීම සඳහාත් ප්‍රමාණවත් නොවන බව ප්‍රකාශ කළා ය. ලංකාවේ කොතරම් දුකක් වින්දද ඇය නැවත විදේශගත නොවන බව ද සඳහන් කළාය. එයට හේතු වී ඇත්තේ ඇය එහිදී විඳිනු ලැබූ දුක් පීඩනයක් බව, ඇය ප්‍රකාශකර සිටියා ය.

"අපේ ලංකාවේ දරුවෝ සීයක් හදනවාට වඩා අමාරුයි එහෙ එක දරුවෙක් හදන එක. පුංචි දේකටත් එන්නේ පිහි අරගෙන කපන්න, කොටන්න"

ඇය විදේශගත වී ගෙවූ ජීවිතය අමිහිරි අත්දැකීම්වලින් සමන්විත වූවකි. ගෙවන් කිහිපයකදී ම පහරදීම්වලට ලක්ව ඇත. එම නිසා ම ඇය නැවත විදේශ ගතවීමට කැමැත්තක් නොදක්වයි. ඇය ලංකාවට පැමිණෙනවිට රු. 30,000 මුදලක් පමණක් රැගෙන ආ බවත් එයින් නිවසක් හැදීමට අත්තිවාරම දැමූ බවත් ප්‍රකාශ කළා ය.

තවද විදේශ ගතවීමෙන් සමහරු වාසිදායක තත්වයන් මෙන් ම අවාසිදායක තත්වයන්ට ද මුහුණ දී ඇත. ඇය 5 ශ්‍රේණියට අධ්‍යාපනය ලැබූ වයස 42 වූ කාන්තාවකි. ඇයට ගැහැණු ළමයෙන් සහ පිරිමි ළමයි දෙන්නෙක් සිටිති. ස්වාමියා පොළොන්නරු ප්‍රදේශයේ වී ගොවිතැන් කිරීම සඳහා ගොස් එහිදි වෙනත් විවාහයක් කරගෙන ඇත. ඇය විදේශ ගතවීමට හේතුව ලෙස දක්වා සිටියේ

"අප්පච්චි නැති දරුවන්ගේ අනාගතය ගැන හිතලා රට ගියෙ. දරුවන්ට ඉන්ඩ හිටින්න තැනක් නැහැ. ඔවුන් ලොකු වෙනකොට තමයි මේවා තේරෙන්නේ.

එතකොට අපිට බනියි මොනවද අපි වෙනුවෙන් කරලා තියෙන්නෙ කියලා. අඩු ගානේ ගේ පොඩ්ඩක්වත් හදලා දෙන්න කියලා හිතලා තමයි රට ගියේ.......”

ඇය ද විදේශගතව ඇත්තේ මුදල් ණයට ලබගෙනය. තමන්ගේ සහෝදරයාට සල්ලි එවා ඇති නමුත් ඒ එවන ලද මුදල් නාස්තිකොට ඇත. එබැවින් යළිත් විදේශගතව ඇත. ඇය තම දරුවන් මහලු මව භාරයේ තබන ලදී. මේ අතර ඇය මුහුණ දී ඇති කණගාටුදායක තත්වය දී ඇත්තේ ඇගේ වැඩිමහල් පුතා හදිසියේ අසනීප වීමයි. මේ පිළිබඳ ඇගේ අදහස වූයේ.

“දරුවෝ අම්මාට බාර දීලා ගියේ. අම්මට වයසයි. කිසි ම දෙයක් තේරෙන්නෙ නෑ. ඉතිං ලොකු පුතා යාළුවොත් එක්ක එකතුවෙලා මත් ද්‍රව්‍ය අරගෙන. ඒක නිසා අසනීප වුණා. (මොළේ අමාරුව), ලොකු දුව ගෙදර හිටියත් මල්ලී ගොඩක් සැරයි. එයා අක්කට බය නෑ මම රට ගිය නිසා තමයි එහෙම වුණේ. මම හිටිය නම් එහෙම දෙයක් වෙන්න දෙන්නේ නෑ.”......

දෙවන වතාවේදී විදේශගත වූ පසු ඉපැයූ මුදල් දියණියගේ නමට බැංකුවට එවූ බවත් දියණිය ඒ මුදලින් මිදුලේ පැවති කළුගල කඩා ඉවත් කොට ගෙය සෑදීමට අත්තිවාරම සකස් කොට අවහ්‍ය ගඩොල් සහ දැව සම්පාදනය කොට තිබූ බවත් ප්‍රකාශ කළා ය. එමෙන් ම වැඩිමහල් දරුවාගේ අසනීප තත්වයට ද වියදම් කොට ඇති අතර දරුවාට පාසැල් යෑමට අවශ්‍ය කටයුතු ද එම මුදලින් සිදු කොට ඇත. දෙවනවර විදේශගතව සිට පැමිණෙන විට රුපියල් 25,000 රැගෙන විත් ඇති අතර එම මුදලින් නිවසේ කාමර දෙකක් ගොඩ නගා ඇත. වත්මන වන විට වැඩිමහල් දරුවා සුවය ලබා ඇති අතර ඔහු ඇඟළුම් හලක සේවයේ නියුතු වේ. එසේම කුඩා දරුවා පාසැල් අධ්‍යාපනය ලබමින් සිටින අතර දියණිය හා මව බීඩි එතීමේ නියුක්තව සිටී මේ වන විට දැඩි ආර්ථික අපහසුවකින් නොපෙලුනත් ඇයගේ අදහස වී ඇත්තේ යළිත් විදේශගත වීමය. මෙයට සාධක ලෙසින් ඇය දක්වා සිටියේ.

“ලොකු පුතාගේ අසනීප දැන් හොඳ වුනත් එයාට අවුරුදු 05ක් දිගට ම බෙහෙත් කරන්න ඕන. මේ ගේ ඉතුරු වැඩ ටික ඉවර කරන්න ඕන. දරුවෙකුට ඉන්නවත් හරියට තැනක් නෑ. මේ ගේ තියෙන ඉඩමත් අපිට අයිති නෑ. ඒක බේරා ගන්නත් තියෙනවා. මහත්තයාගේ සිහිය විලක් වෙලා වගේ හිටපු කාලේ මට හොරෙන් මේවා සේරම වෙනත් අය ඒ අයගේ නමට පොඩි මුදලක් දීල ලියවගෙන, දැන් ඉන්න ටික පවා අනුන්ගේ. දැනටමත් මේ ළමයි එයාලට මොනවද කළේ කියලා

අහනවා. ඉතිං ඉන්ට තැනක් හරි හදලා දෙන්ට ඕන. බීඩි එතුවට ඒකෙන් ලැබෙන්නේ සුළු මුදලක්, පුතාගේ ඉස්කෝලෙටයි. සමිතිවලටයි ගියාම ඉතිරි මුදල වියදමට මදි. වෙනත් ආදායම් නෑ. ඉතිං ආයෙමත් රට යන්න හිතුවේ ඒකයි. ගේවත් හදලා තිබුණ නම් ආයේ යන්නේ නෑ. මේ පාර ගිහින් ඇවිත් දුවගේ විවාහය ගැන හිතනවා. පොඩි පුතා ඉගෙන ගන්ට දක්ෂයි. ඒත් පංතියකටවත් යවන්න විදිහයක් නෑ. දරුවෝ ගැන හිතලා තමයි ආයෙමත් යන්න තීරණ කළේ.''

මෙවර විදේශගත වීමෙන් බාල පුතාත් මෙවැනි තත්ත්වයකට මුහුණ පායි ද ? යන ප්‍රශ්නයට ඇය පිළිතුරු දුන්නේ

''චූටි පුතාත් එහෙම වෙයිද කියලා භයක් තියෙනවා. මොනව කරන්නද ඉන්න තැනවත් හදා ගත්තා නම් යන්නේ නැහැ. කෑම ටික නම් කොහොම හරි හොයාගන්න පුළුවන්. අනෙක කෙල්ල දීග දෙන්නත් මොනවා හරි තියෙන්න එපාය. ඒ නිසා ආයෙත් යන්න අදහස් කළේ.''

විදේශගත වීමේදී විවිධ හිරුහැරවලට භාජනය වුව ද අනාගත පිළිබඳ පවත්නා බලාපොරොත්තු සහගත බව හේතුවෙන් ඇය යළිත් එහි යෑමට බලපොරෝතුව සිටී.

මොවුහු සංක්‍රමණය වීමේදී මූලික අරමුණ දරුවන් බව ප්‍රකාශ කරයි. මොවුන් අවස්ථාවක පැහැදිලි වන්නේ ස්ථිර නිවසක් ගොඩ නගා ගැනීම බවයි. අයැ මෙවර විදේශගත වන්නේ වයස 21ක් වූ වැඩිමහල් දියණියත් මානසික රෝගියෙකු වූ වැඩිමහල් පුතාත් සහ බාල පුතා යන තිදෙනා අඩක් නිම කරන ලද නිවසෙහි හුදෙකලා කොටය.

විදේශගත වීමෙන් ජීවිතය සාර්ථකත්වය කරා මෙහෙය වූ කාන්තාවක් ලෙස මැගිලින් මහත්මිය දක්විය හැකිය (වයස අවු. 46) ඇයට පිරිමි දරුවන් සිවු දෙනෙක් සහ එක් දියණියක් සිටී. ඇය දෙවතාවක් විදේශගතව ඇත. ස්වාමියා ද ස්ථිර රැකියාවක් නොකරන අතර මත්පැන් පානයට දැඩිය යොමු වූවෙකි. ඇය පළමුවන වතාවේ කුවේට් හි සේවය සඳහා ගිය අතර මේ වන විට ඇගේ දරුවෝ ඉතා කුඩාවියෙහි පසු වූහ. කුවේට්හි සේවය කරන අතරතුරු ඇය විවිධ හිරිහැරයන්ට භාජනය වී ඇත. කුවේට් පැවති යුද්ධය මෙහිදී විශේෂ වී ඇත. ඒජන්සියට මුදල් ගෙවා ඇය වෙනත් නිවසක් සේවය සඳහා සොයාගෙන ඇත. කෙසේ වුව ද ඇය තම ස්වාමියා භාරයට මුදල් (ලක්ෂ එක හමාරක්) එවා තිබූ අතර ඇය නැවත

පැමිණෙන විට ඒ මුදල්වලින් කිසිවක් ඉතිරිවී නොමැති බවත් ප්‍රකාශ කර සිටියාය සැමියා සුරාපානය ආදී කටයුතු සඳහා වියදම් කොට සියල්ල විනාශ කර ඇත. නිවසක් සෑදීමට අත්තිවාරමකුදු දමා නොමැති බවත් ඇය ප්‍රකාශ කළා ය. ඉන් අනතුරුව යළිත් ඇය සව්දිහි සේවය සඳහා ගොස් ඇත. එහි දී නිවසේ අවශ්‍යතාවන් සඳහා සරිලන ප්‍රමාණයෙන් පමණක් මුදල් එවූ ඇය ඉතිරි වැටුප් ප්‍රමාණය සුරක්ෂිත කොට ගෙන ඇත එම මුදලින් ඉඩමක් ගත් බව ඇය කිවාය. තමා විදේශගත වීම සඳහා ස්වාමියාගේ අනුමැතිය ලැබුණ බවත් පවුල විනාශ වීමට ඉඩ නොතබා තම ශක්තියෙන් සාර්ථකත්වය ළඟා කරගත් බවත් ප්‍රකාශ කළ ඇය වත්මන් තත්ත්වය පිළිබඳ සතුටු වන බවත් ප්‍රකාශ කළාය. එසේ වුවත් තමා දරුවන් අසල නොසිටීම හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපනය අතරමග නැවැත්වීමට සිදු වීම පිළිබඳ ඇය කණගාටුවෙන් පසු වේ. විශේෂත්වය වන්නේ තම බාල පුතාට අධ්‍යාපනය ලදී ඇත්තේ ඇය තම විදේශගත වීමෙන් උපයාගත් මුදලෙනි. මේ පිළිබඳ ඇයගේ අදහස් වූයේ.

"මම රට ගිය නිසා ළමයින්ගේ අධ්‍යාපනය බිඳ වැටුණා. එයලාගේ තාත්තා කිසි දෙයක් කළේ නැහැ. දරුවන්ගේ ඉගෙනීම ගැන සොයා බැලුවේ නැහැ. ඒ ගැන දුකයි. ඒත් මම ගෙදර හිටිය නම් වියදම් කරන්න සල්ලිත් නෑ.. බාල පුතා උසස් පෙළ විභාගේ ලීවා. බාල පුතා මේ තත්වෙට ගෙනාවෙ රට ගිහින් සල්ලි හොයා ගත්ත නිසාත්, මම මෙහෙ හිටපු නිසාත් කියලයි මට හිතෙන්නේ."

වත්මන් තත්ත්වය පිළිබඳ සතුටු වන ඇය මේ වන විට බීඩි එතීමෙහි නිරතව සිටී. තවත් විශේෂ හේතුවක් ලෙසින් ඇගේ එක ම දියණියන් ද විදේශගත වීම දක්විය හැකිය. දූන් දියණියන් ද පුතා ද ඇයට අවශ්‍ය දෑ සපයන බවද ඇය ප්‍රකාශ කළා ය.

"මම දූන් දුප්පත් කියලා හිතන්නේ නැහැ. ඒ දූන් ඉස්සර තරම් පහළ තත්වයක නැති නිසා"

විදේශගත වීමට හේතු වශයෙන් ඇය දක්වා සිටියේ, ස්වාමියාට රැකියාවක් නොමැති වීම, ළමයින්ගේ අනාගතය සැළසුම් කිරීම, ආර්ථික ශක්තියක් නොමැති වීම යන කරුණු ය. කෙසේ වෙතත් ඇය ස්ථිර නිවසක් ගොඩනගා ගෙන ඇති අතර මිළයට ගන්නා ලද පොල් ඉඩමෙන් ද ප්‍රමාණවත් ආදායමක් ලබන බව ප්‍රකාශ කළාය. ඇගේ ආකල්පයන් අන් කාන්තාවන්ගෙන් වෙනස් වන්නේ ඇය උපයන ලද මුදල් ආදායම් උත්පාදනය කෙරෙහි යොමු කිරීමේ අරමුණයි. ඒ නිසා ම ඇය අද ජීවත්වීම සඳහා ප්‍රමාණවත් ආදායමක් ලබන බව ප්‍රකාශ කළා ය.

05. **සාකච්ඡා**

දරිද්‍රතාව හා විදේශීය සංක්‍රමණය නම් ප්‍රපංච දෙක අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධතාවක් දක්වයි. දරිද්‍රතාව නිසා විදේශ සංක්‍රමණ වන අතර ඒ තුළින් ඔවුහු දිළිඳු බවින් අත් මිදෙත් ද ? යන ගැටලුව මතුවනු ඇත. මන්ද යත් මෙම ජනතාව දරිද්‍රතාව පිළිබඳව පවත්නා ආකල්පයන් වේ. දිළිදුබව ලෙස අර්ථ දක්වන්නේ යම් කිසි පුද්ගලයෙකුට අවශ්‍යය අවම පරිභෝජන සක්‍යතාව ලබා ගැනීමට නොහැකි වූ තත්ත්වයකි. එනමුත් මෙම නිසා මොවුනට අවශ්‍ය වන්නේ ඒ සඳහා ප්‍රමාණවත් ආදායම් මාර්ගයකි. එහෙත් මෙම ජනතාව දිළිඳුබව ලෙස අර්ථ දක්වන්නේ ඔවුනට ස්ථිර නිවසක් නැති කම, ගෘහ භාණ්ඩ නැතිකම යනාදියයි. විදේශගත වීමේ අරමුණ ද ඒවා ලබා ගැනීමයි. එහෙත් මේ තුළින් ඔවුන්ගේ දරිද්‍රතාවන් මිදීමට ඔවුන් සමත් වී නොමැත. මෙම තත්ත්වය කොටස් දෙකකට බෙදා විග්‍රහ කළ හැකිය. 1. ප්‍රතිකර්මීය පිළියම්, 2. නිවාරණීය පිළියම් වශයෙනි.

ප්‍රතිකර්මීය පිළියම් යනු පවතින තත්ත්වයට කෙටි කාලීනව දෙන පිළියම් ය. එම පිළියම් කිරීමේ ක්‍රමය නවතාලීමෙන් පැවති තත්ත්වය නැවත උදාවනු ඇත. විදේශගතවන කාන්තාවෝ ද අවුරුදු කිහිපයක් තුළ උපයන මුදලින් නිවසක් තනා ගැනීම සහ ගෘහයට භාණ්ඩ ලබා ගැනීම සිදු කරති. ක්‍රමික ආදායම් මාර්ග නැතිවීමෙන් ගෘහභාණ්ඩ උකස් තැබීම, විකිණීම වැනි තත්ත්වයන්ට ඔවුහු නැවත පත්වෙති. අවසානයේ ඔවුනට ඉතිරිවන්නේ සම්පූර්ණ කළ ස්ථිර නිවස හෝ අඩක් නිමකරන ලද නිවස පමණි. මේ තත්ත්වය හේතුවෙන් මොවුහු නැවතත් විදේශගතවීම කෙරෙහි යොමුවෙති. මෙය චක්‍රයක ආකාරයෙන් සිදු වේ. දිළිඳුකමෙන් මිදීමට මේ ආකාරයෙන් මොවුනට නොහැකය.

නිවාරණීය පිළියම් යනු දිළිඳුබවෙන් සම්පූර්ණයෙන් ම මිදීමට ක්‍රියා කිරීමයි. ඒ සඳහා ක්‍රමික ආදායම් මාර්ගයක් සකසා ගතයුතුව ඇත. විදේශගතව උපයන මුදල් ඒ සඳහා ආයෝජනය කළ යුතු වේ. එහෙත් විදේශගත වන ගෘහ සේවිකාවන්ගෙන් අතලොස්සක් පමණ ඒ සඳහා යොමු වෙති. මෙය දිගුකාලීන සැළසුම්පත ක්‍රමයක් ලෙස හැඳින්විය හැකි. නිසි ආදායම් මාර්ගයක් සලසා ගැනීමෙන් ජීවන තත්වය නිසි අයුරින් පවත්වා ගත හැකිය. ඒ සඳහා මොවුන් මුදල් ආයෝජනය කිරීමේ තත්ත්වයක් කෙරෙහි යොමුවිය යුතුය.

අධිපරිභෝජනය (Conspicuous Consumption) ද මෙම ජනතාවගේ දිළිඳුකම කෙරෙහි බලපෑම් කරයි. මොවුන් අත මුදල් ගැවසෙන වන විට අද දවස ගැන පමණක් සිතීම නිසා දිළිඳුකමින් මිදීමට නොහැකි වෙයි. එබැවින් මොවුහු මුදල් පරිහරණය පිළිබඳ සහ පරිභෝජනය පිළිබඳ කළමනාකාරිත්වයකින් හෙබි පිරිසක් බවට පත් නොවෙති. ඒ සඳහා මොවුනට දැනුමක් නොමැත. මේ නිසා විදේශගතව මොවුන් කොපමණ මුදලක් ඉපයුව ද දිළිඳුබවෙන් මිදීමට නොහැක. තව ද පරිභෝජනයේ දී මධ්‍යම පාංතික සමාජීය ලක්ෂණ අනුකරණය කෙරෙහි යොමුවීමක් ද පෙන්නුම් කරයි.

මොවුහු නිවාස ඉදිකිරිම්, භාණ්ඩ මිලදී ගැනීමේදී මේ තත්ත්වය පෙන්නුම් කරති. නිවාස ඉදි කිරීමේදී මධ්‍යම පාන්තික මට්ටමේ නිවාස ඉදිකිරීමට යාම හේතුවෙන් (ලොකු නිවසක්) ඒවා නිම කිරිමට නොහැකිව අතර මැද නවතී. අනෙක් අතට නවීන තාක්ෂණික භාණ්ඩ සඳහා විශාල මුදලක් වැය කරයි. (ටී. වී. කැසට් රෙකෝඩර්, රයිස් කුකර්, අවන් ) විදුලි භාණ්ඩ භාවිතය නිසා මාසික විදුලි බිල් පත ගෙවා ගැනීමට නොහැකි වන තත්ත්වයන් ද දැකිය හැකිය. ඉතිරි කිරීම් නැති නිසා ම ආපදා තත්ත්වයන්හිදි මෙම භාණ්ඩ අඩු මුදලකට විකිණීම සිදු කරති. මෙම මධ්‍යම පන්තික පවුල් අනුකරණයන් මොවුන්ගේ දිළිඳුකම කෙරෙහි ඍණාත්මකව බලපා ඇත. මෙම මුදල් අවසන් වී අසරණ වන මොහොතේ නැවත විදේශගත වීම කෙරෙහි ඔවුහු යොමු වෙති. මේ තත්ත්වයෙන් විදේශගතවීම චක්‍රාකාරයෙන් සිදු වේ.

මෙම සියල්ල සලකා බැලීමේදී පැහැදිලි වන්නේ කෙටිකාලින අරමුණු මත පදනම් ව දරිද්‍රතාව කෙරෙහි දකින දෘෂ්ටිකෝණය වෙනස් කළ යුතු බවයි. තාවකාලිකව පවතින ප්‍රතික්‍රියාත්මක දෘෂ්ටිකෝණයේ එල්බ සිටින තුරු ඔවුහු දිළිඳුකමින් මුදවා ගත නොහැකි වෙති. ඒ නිසා ඉහතින් සඳහන් කළ පරිදි නිවාරණාත්මක පිළියම් ලෙස ආයෝජනය කෙරෙහි එනම් ස්වයං රැකියා, කුඩා පරිමාණ වෙළඳාම් ආදියට ඔවුහු යොමු කළයුතු වෙති. ඒ සඳහා අවශ්‍ය උපදේශනය සජීවීකරණ ක්‍රියාවලියක් හරහා ලබා දිය යුතුව ඇත. ඒ තුළින් සංක්‍රමණික චක්‍රයෙන් සහ දිළිඳු බවින් මොවුන් මුදවාගත හැකිය. එහිදි මෙම ජනතාවගේ දිළිඳු බව පිළිබඳ පවත්නා ආකල්පයන් වෙනස්කල යුතුව ඇත. තවද විදේශගත වන්නන් විදේශගතවීමට පෙර හා විදේශගතවීමෙන් අනතුරුව මුහුණපාන ගැටලු කෙරෙහි රජය හා ඒ සම්බන්ධ ආයතන සැලකිල්ල යොමු කළ යුතු වේ. එසේ කිරීමෙන් විදේශගත වීමේ සමාජ ව්‍යාපාරය ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම සඳහා යොදා ගතහැකි හොඳ ම මාර්ගයක් බවට පත්වනු නොඅනුමානය.

## ඇසුරුකළ පොත්/Bibliography


අත්තනායක චන්ද්‍රා 1996, "නුපුහුණු ශ්‍රමිකයන් මැදපෙරදිගට සංක්‍රමණය වීම" ආර්ථික විමසුම, මහබැංකු ප්‍රකාශන, වෙළුම 21, අංක 10

ජයවික්‍රම, ආනන්ද, ජේ. ඇම්. 1999, "ශ්‍රී ලංකාවේ ශ්‍රම අපනයනය, ක්‍රියාකාරීත්වය හා අනාගත ඉඩප්‍රස්තා", සමාජ විද්‍යා විමර්ශන, වෙළුම 1, සමාජවිද්‍යා කේන්ද්‍රය, පේරාදෙණිය.

විනීතා ජයසිංහ, ආර්ථික විමසුම, 1981, "මැද පෙරදිග සංක්‍රමණ", මහබැංකු ප්‍රකාශණ, වෙළුම 07, අංක 1

Abyrathna Bandara, 2000 "Rural Poverty in Sri Lanka" Advisor, Ministry of Youth Affairs, Sports and Rural Development, Colombo

Gunathilaka, Godfrey 1998. "The role of Network and Community Structure in International Migration from Sri Lanka" Edited by Emigration Dynamics in Developing Countries, Vol : 2 South Asia Aldershot, Ashgate.

Hettige, S. T. 1988, Sri Lanka Journal of Social Science" Migration of Sri Lanka Workers to the middle-east ; a sociological viewpoint" Vol 2, No. 1-2

Indra Tudawe, 2000, "Chronic Poverty and Development Policy in Sri Lanka, overview study" Colombo Research Center

Korale RBM, 1983 "Migration for employment to the Middle East : it's Demographic and socio-economic effect on Sri Lanka" Ministry of plan implementation, Colombo

Malsiri, Dias 1989, "Family Relation and the Role of Women" marga, Colombo

Rathnayake, Kanthi 1999, "Female Migration from Sri Lanka to the Middle East : Is the remedy worse than the disease", Sri Lankan journal of population Studies, Vol. 2, Colombo

Ruhunage, L. K. 1996, "Sri Lanka Labour migration trends and threats", Sri Lanka Labour Gazette, Vol. 47, Colombo

Statistical hand book on migration Colombo Employment, 2000, Sri Lanka bureau of foreign, Colombo

Vijitha, franando, 1990, "Children of migrant house maids-where responsibility" Second National Convention on Women's Studies, Colombo